# සාමාන්‍ය සමයේ විසිසත්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

ජෝවෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෝවෙල් 1: 13-15, 2 : 1-2

"සමිඳාණන් වහන්සේගේ දවස පැමිණෙන්නේ ය. එය කළුවර අඳුරු දවසක් ය."

"පූජකවරුනි, ගෝණි රෙදි ඔතාගෙන වැලපෙන්න. පූදසුනේ සේවකයෙනි, කෑ මොර ගසන්න. පූජකවරුනි, පූදසුනේ සේවකයෙනි, කෑ මොර ගසන්න.

පූජකවරුනි, ගෝණි රෙදි පොරවාගෙන මුළු රැයක් වැතිර සිටින්න.

මන්ද, ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ මාලිගාවේ පිදීමට ආහාර පූජාවත්, පානීය පූජාවත් කිසිත් නැත. උපවාසයක් නියම කරන්න. අයැදුමට සෙනඟ රැස් කරන්න. ප්‍රජා මූලිකයන් සහ රටේ සියලු වැසියන් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේගේ මාලිගාවට රැස් කරවා උන් වහන්සේට මොර ගසන්න.

අහෝ ඒ දවස, සමිඳාණන් වහන්සේගේ දවස ආසන්න ව ඇත.

එය සර්ව පරාක්‍රමයාණන් වෙතින් විනාශයක් සේ පැමිණෙනු ඇත.

“සියොන්හි හොරණෑව පිඹින්න. දෙවිඳුන්ගේ ශුද්ධ කන්දේ අනතුරු හඬ නගන්න.

දේශයේ සියලු වැසියෝ වෙවුලත් වා!
මන්ද, සමිඳාණන් වහන්සේගේ දවස පැමිණේ. එසේය, එය ආසන්න ය.
ඒ දවස කළුවර දවසක් ය. වලාකුළු සහිත ඝන අඳුරු දවසක් ය. ගන අඳුරු කඳු පිට පැතිර යන්නාක් මෙන් මහා හමුදාවක් පැමිණෙන්නේ ය.

එවැන්නක් කිසි කලෙක නොවීය. මතු පරම්පරාවල කවරදාවත් නොවන්නේ ය.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 9:1-2, 5, 15, 7-8

පිළිතුර: සමිඳාණෝ දැහැමිකමින් අප විනිශ්චය කරන සේක.

ගීය:

සමිඳුනි, හද පත්ලෙන් මම ඔබට තුති පුදමි. ඔබ කළ හැම අසිරිමත් ක්‍රියා පතුරා හරින්නෙමි.
ඔබ ගැන සිත සිතා කුල්මත් වී උදන් අනන්නෙමි.
මහෝත්තමයාණෙනි, ඔබේ නම ප්‍රශස්ති ගීතයෙන් පසසන්නෙමි.

ජාතීන්ට තරවටු කොට, අදමිටුවන් විනාශ කොට, ඔවුන්ගේ නම සදහට ම මකා හරින සේක.
විජාතීහු වළක් කපා එම වළෙහි වැටී සිටිති. එලෙස ම උගුලක් අටවා එම උගුලට අසු වී සිටිති.

සමිඳාණෝ සිහසුන් අරා සදා වැඩ සිටින සේක. විනිසය පිණිස සිය සිහසුන පිහිටෙවූ සේක.
එතුමාණෝ දැහැමිකමින් මුළු ලොව නඩු විසඳාලන සේක.
ජාතීන් යුක්ති සහගත ලෙස විනිශ්වය කරන සේක.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති.
මම ද ඔවුන් අඳුනමි. ඔව්හු ද මා පසුපස්සේ එති"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

තොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මේ ලෝකය පිළිබඳ විනිශ්වයේ මොහොත දැන් ය.
මා පොළොවෙන් ඔසවනු ලැබූ කල සියල්ලන් මා වෙතට ඇදගන්නෙමි"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 11: 15-26

"මම දෙවියන් වහන්සේගේ අනුහසින් යක්ෂයන් දුරු කරම් නම් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙහි උදා වී ඇත."

ජේසුස් වහන්සේ වරක් ගොළු යක්ෂයන් දුරු කළ විට සමූහයා පුදුම වූහ. එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් 'මොහු යක්ෂයන් දුරු කරන්නේ යක්ෂාධිපති වූ බෙල්සෙබුබ්ගේ අනුහසින් ය'යි කීහ. අන් සමහරු උන්වහන්සේ වචනයකින් අල්ලා ගන්නා පිණිස ස්වර්ගයෙන් හාස්කමක් උන්වහන්සේගෙන් ඉල්ලූහ. උන්වහන්සේ ඔවුන්ගේ සිතුවිලි දැන මෙසේ වදාළ සේක. "ඊට ම විරෝධීව භේද වූ යම් රාජ්‍යයක් ඇද්ද එය පාළු වන්නේය. ඊට ම විරෝධීව භේද වූ යම් ගෙදරක් ඇද්ද එය පිරිහී යන්නේය. සාතන් ඔහුට ම විරෝධීව භේදව සිටී නම් ඔහුගේ රාජ්‍යය පවතින්නේ කෙසේ ද? මා යක්ෂයන් දුරු කරන්නේ බෙල්සෙබුබ්ගේ අනුහසින් යයි ඔබ කියන්නාහු ය. එහෙත් මම බෙල්සෙබුබ්ගේ අනුහසින් යක්ෂයන් දුරු කරම් නම් ඔබගේ අනුගාමිකයෝ කවරෙකුගේ අනුහසින් ඔවුන් දුරු කරත් ද? මෙලෙස ඔබේ අනුගාමිකයෝ ම ඔබේ තර්කය බිඳ දමති. එහෙත් මම දෙවියන් වහන්සේගේ අනුහසින් යක්ෂයන් දුරු කරම් නම් සැබැවින්ම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙහි උදා වී ඇත. අවි ආයුධ ගත් බලවත්තයකු සිය නිවෙස රක්නා කල ඔහු සතු දේපළ සුරක්ෂිතව ඇත. එහෙත් ඔහුට වඩා බලවත්තයෙක් අවුත් ඔහු යටපත් කළහොත් ඔහු විශ්වාසය තැබූ ආයුධ පැහැරගෙන, කොල්ලකාගත් දේ බෙදා ගන්නේය. මාගේ පක්ෂයට නොවන්නා මට විපක්ෂය. මා සමඟ රැස් කිරීමට උදව් නොකරන්නා විසුරුවා දමන්නේය."

“අශුද්ධාත්මය මිනිසකුගෙන් දුරුව ගිය කල ඔහු දිය නැති තැන්වල සැරිසරමින් නවාතැනක් සොයන්නේ ය. එය නොලදහොත් “මා නික්ම ආ මාගේ නිවසට ආපසු යමි”යි කියන්නේය. එහු එහි පැමිණි කල නිවස අතුගා අස්පස් කොට තිබෙනු දකියි. එවිට ඔහු ගොස් තමාට වඩා දුෂ්ට වූ තවත් ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය. ඔව්හු ඒ නිවසට පිවිස එය අරක්ගනිති. එවිට ඒ පුද්ගලයාගේ දෙවන තත්ත්වය පළමු තත්ත්වයට වඩා නපුරු වන්නේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.